චක්‍රලේඛ අංක: 07/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2017. 05.04.

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**කළමනාකරණ අවදානම් දීමනා ගෙවීම**

ශීර්ෂගත කාරණයට අදාල කොමිෂන් සභා චක්‍රලේඛ 2/2016ට වැඩිමනත් වශයෙනි.

02. බස්නාහිර පළාත් සමුපකාර සමිතිවල කළමනාකරණ මට්ටමට අයත් පහත සඳහන් තනතුරුවල සේවය කරන නිලධාරීන් වෙත රාජකාරීමය වශයෙන් පැවරී ඇති වගකීම් සහගත තත්ත්වයන් පිළිබඳව සැලකිල්ලට ගනිමින් කළමනාකරණ අවදානම් දීමනාවක් ලබාදීමට කටයුතු කල යුතු බව කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

| වැටුප් පරිමාණය | තනතුර | කළමනාකරණ අවදානම් දීමනාව |
|---|---|---|
| 102:04 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතන හා සංවර්ධන) | රු.2500 -රු.3500 අතර |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) | |
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | |
| 102:05 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | රු.2000 - රු.3000 අතර |
| | ගණකාධිකාරී | |

03. ඉහත දීමනා හිමිවීම සඳහා පහත කොන්දේසි සපුරාලිය යුතුය.

I බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලත් සේවය ස්ථිර වූ නිලධාරියෙකු හෝ නිලධාරිණියක් විය යුතුය.

II රාජකාරී ඉටුකිරීමේ පදනම මත පත්කරන සිටින නිලධාරීන් සඳහා හිමිවන්නේ නියමිත දීමනාවෙන් අඩක් පමණි.

III වැඩ බැලීමේ / රාජකාරී ඉටුකිරීමේ පදනම මත පත්කරන සිටින නිලධාරීන් සඳහා මෙම දීමනාව හිමිවන්නේ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පත්වීම් කාල සීමාව සඳහා පමණක් වේ.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/ගම්පහ/කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්